# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1601/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 18/10/2024<br>පැය 1045 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය**

2024.10.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කඩුවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කඩුවෙල පොලිස් වසමේ කොළඹ - අවිස්සාවේල්ල මාර්ගයේ කඩුවෙල මහජන පොළ අසල වැටලීමක් සිදුකර කේරළ ගංජා කිලෝ 04 ග්‍රෑම් 80 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කඩුවෙල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වූ කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කඩුවෙල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. අනවසරයෙන් පතල් කැණීම් කටයුතු සිදු කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර.**

2024.10.17 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අවිස්සාවේල්ල පොලිස් වසමේ දෙහිගහපිටිය පල්ලිය ප්‍රදේශවලදී වැටලීම් සිදුකර අනවසරයෙන් පතල් කැණීම් කල පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන අවිස්සාවේල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38 හා 45 වයස් වල පසුවන අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ට්‍රැක්ටර් රථයකට පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුර.**

2024.10.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අම්බලන්තොට පොලිස් වසමේ ලියන්ගස්තොට ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ට්‍රැක්ටර් රථයකට පටවමින් සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන අම්බලන්තොට පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ බරවකුඹුක ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

අම්බලන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.10.17 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රත්නපුර පොලිස් වසමේ දෙනියවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 120 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකල හැකි මුදල් රුපියල් 93,000/- ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රත්නපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ දෙනියවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

රත්නපුර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුර.**

2024.10.17 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගොවිදුපුර පොලිස් වසමේ ගල්ගේගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර නීති විරෝධි මත්පැන් නිෂ්පාදනයට යොදා ගන්නා ගෝඩා ලීටර් 110 ක්, යකඩ බැරල් 01 ත් තඹ දඟර 01 ක් හා මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගොවිදුපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වූ මොනරාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගොවිදුපුර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**